# වැඩ බැරි දාස ගැන කතා

නිකොලායි නෝසව්

4



# වැඩ බැරි දාස කවි ලියපු හැටි



KANOL PUBLISHING HOUSE (PVT) LTD.

# වැඩ බැරී දාස ගැන කතා

## නිකොලායි නෝසව්

4

# වැඩ බැරි දාස කවි ලියපු හැටි


අනුවාදය - දැදිගම වි. රුද්රිගු

චිත්‍ර - බරීස් කලෞෂීන්

පරිගණක සැලසුම - මාලක ලලනජීව



මුද්‍රණය 2024





KANOL
PUBLISHING HOUSE (PVT) LTD.





වැඩ බැරි දාස චිත්‍ර ඇඳීමට පටන් අරගෙන මුහුණ පෑ කරදරය ඔය ළමයින් දන්නවා නොවැ. ඔන්න ඉතින් ඉන් පසු ඔහු කවි ලියන්න පටන් ගත්තා. ඔහු අඳුනන කවියෙක් හිටියා ඔදුවාන්චික් මල් වීදියේ. එයාගෙ හැබෑ නම පූදික්. එහෙත් කවීන් ලස්සන නම්වලට කැමැති බව ප්‍රසිද්ධ දෙයක්. ඉතින් පූදික් කවි ලියන්න පටන් ගත්තයින් පස්සෙ එයා 'කවි කුසුම්' යන නමින් ප්‍රසිද්ධ වුණා.

වැඩ බැරි දාස දවසක් දා කවි කුසුම් හමුවීමට ඇවිත් මෙහෙම කිව්වා.

"කවි කුසුම්, මාත් කැමතියි කවියකු වීමට. මට කවි හදන හැටි උගන්වන්න"

"කවි තැනීමට ඔයාට දක්ෂතාවක් තියෙනවද?" කවි කුසුම් ඇහුවා.

"අපොයි තියෙනවා. මම බොහොම දක්ෂ ළමයෙක්," වැඩ බැරියා පිළිතුරු දුන්නා.

"එය හොයා බලන්න ඕන. ඔයා රිද්මය, එළිසමය වගේ දේ දන්නවද?"

"අපොයි, ඒවා දන්නෙ නැහැ."

"වචන එක විදිහේ ශබ්දයකින් අවසන් වෙන විට ඒකට එළිසමය කියලා කියනවා. උදාහරණ මෙන්න: බස්සා-කුස්සා, මැස්සා-පිස්සා. දැන් ඔයාට තේරුම් ගන්න පුළුවන්ද?"

"ඔව්, තේරුම් ගත්තා"

"එහෙනම්, 'වත-ගොත' නමැති වචනයට පෑහෙන වචනයක් කියන්න" කවි කුසුම් ඉල්ලා සිටියා.

"ළපටි සිත" බැඩ බැරි දාස ගත් කටටම කියාපි.

"ඔතන එළිසමය හරි නැහැ. ඒ වචනවල ගැළපීම හරි නැහැ," කවි කුසුම් කිව්වා.

"ඇයි නැත්තෙ? වචන දෙකම ඉවර වෙන්නෙ 'ත' ශබ්දයෙන් නෙව."

"ඒ විතරක් මදි. වචන දෙකම ශබ්දය අනුවත් සමාන වෙන්න ඕන. ඔන්න අහගන්න: වත-ගොත, සිත-මෙත. කැත-නැත, ගත-සිත."

"ඔව්! ඔව්! දැන් මට තේරුම් ගත හැකියි! පොල්ල-බෙල්ල, තල්ල-මල්ල, කොල්ලා-බල්ලා, ජුන්ටා-බන්ටා! හා-හා-හා!"







"හොඳයි, එහෙනම් 'කිත්තම්' නමැති වචනයට ගැළපෙන පදයක් හොයන්න." එහෙම කිව්වෙ කවි කුසුම්.

"ලත්තම්," වැඩ බැරි දාස ගත් කටටම පිළිතුරු දුන්නා.

" 'ලත්තම්' කියන්නෙ මොනවාටද?"

"එහෙම වචනයක් නැත්ද?"

"සත්තකින්ම නැහැ."

"එහෙනම් 'ඉරුත්තම්' "

"ඒ වචනයේ තේරුම මොකක්ද?" කවි කුසුම් පුදුම වෙලා ඇහුවා.

"ඉරනවා කියන වචනයෙන් තමයි ඒ වචනය ඇවිත් තියෙන්නෙ," වැඩ බැරියා විස්තර කළා.

"නුඹ බොරු ඇඳ බෑම නවත්වාපන්. වචන ගැළපෙනවා විතරක් නොවෙයි කාව්‍යමය තේරුම් තියෙන්ටත් ඕන. නිකම් බොරුවට හිතෙන් මවා ගන්න එපා"

"වෙනින් වචනයක් මට හිතා ගැනීමට බැරි නම්?"

"එහෙනම් ඔයාට කවි පද බැඳීමට දක්ෂතාවක් නැහැ."

"එහෙනම් කිත්තම් නමැති වචනයට ගැළපෙන වචන නුඹම හදාපන්!" එහෙම කිව්වෙ වැඩ බැරි දාස.

"දැන්ම හදන්නම්!" කවි කුසුම් පිළිතුරු දුන්නා.

ඔහු කාමරය මැද සිටගෙන, දෑත් බැඳගෙන, හිස පැත්තකට හරවාගෙන කල්පනා කරන්න පටන් ගත්තා. ඔන්න ඊට පස්සේ කවි කුසුම් වහලේ සීලිම දෙස බලාගෙන කල්පනා කළා. එයා කාමරයේ එහාට, මෙහාට ගමන් කරමින් තොල් මතුරන්න පටන් ගත්තා.



"කිත්තම්, ලත්තම්, බත්තම්, පත්තම්, නත්තම්," ඔහොම මතුරලා හිටි හැටියේම මෙහෙම කිව්වා.



"මොන කාලකණ්ණි වචනයක් ද! ඒක කවියට ගළපන්න බැහැ!"

"ඔන්න පේනවා නේද, නුඹ කවියෙක් වෙලත් එළිසමය නැති වචන මට දුන්නා. ඊට පස්සෙ කියනවා මම දක්ෂතාවක් නැති කෙනෙක් කියලා" වැඩ බැරි දාස කවි කුසුම්ට දොස් පැවරුවා.

"අපොයි, නුඹට කවි හදන්ට දක්ෂතාවක් තියෙනවා. නුඹ දක්ෂයි, දක්ෂයි. මගේ හිස කකියනවා. නුඹට මම මෙහෙම කියන්නම්, එළිසමය තියෙන්නත් ඕන, කවිවල අදහසක් තියෙන්නත් ඕන. අන්න ඒ වගේ කවි ලියන්න පුළුවන් නම්, නුඹ කවියෙක්"

"ඒක ඒතරම්ම ලේසි වැඩක්ද?" වැඩ බැරි දාස මවිතයට පත් වුණා.

"සත්තකින්ම, ලෙහෙසියි. ප්‍රධාන දේ සහජ දක්ෂතාවක් තියෙන්න ඕන"

වැඩ බැරි දාස ගෙදර ඇවිත් මුළු දවස තිස්සේ ම කවි ගොතන්න පටන් ගත්තා. කාමරය තුළ ඇවිදිමින්, වරෙක බිම බලමින්, තවත් වරෙක සීලිම දෙස බලමින්, දෑතින් නිකට අල්ලා ගනිමින් තොල් මතුරන්න වුණා.

ඔන්න අන්තිමේ දී එයා කවියක් හැදුවා.

"සොහොයුරනි! මම කවියක් පද බැන්දා. මෙන්න අහපල්ලා!"

"ඉතින්, ඉතින් කියාපන්කෝ!" හැම දෙනාම ඔහුගෙන් ඉල්ලා සිටියා.

"මම කවි හැදුවේ නුඹලා ගැනයි. පළමුවැනි කවිය දක්සපාල ගැනයි. මෙන්න අහපල්ලා !-

**දක්සපාල ගියේ ගඟට නාන්නට**
**එළුවට උඩින් පැනලා වැටුණා වළකට!"**

මොනවා? මම වළට වැටුණේ කවදාද?" දක්සපාල ඇහුවා.

"ඒක ඇත්ත තමයි. ඒ වුණාට මම එහෙම ලියුවේ එළිසමය ගළපා ගන්න" වැඩ බැරියා විස්තර කළා.

"ඉතින් නුඹේ එළිසමය රැක ගන්න පට්ටපල් බොරුවක් ඇද බානවද?" දක්සපාල ඇහුවේ බොහොම කේන්තියෙන්.

"සත්තකින්ම, මම ඇත්ත සිද්ධි ගැන ලියන්නේ මොකටද? ඇත්ත ගැන කවි ලියන්න ඕන නැහැ."

"නුඹ තවත් ඔය වගේ කවි ලියුවොත්, නුඹට වැඩ වරදීවි," දක්සපාල තර්ජනය කරලා මෙලෙස ඇසුවා: "ඉතින් නුඹ ලියාපු අනිත් කවි මොනවාද?"

"කඩිනම් රාල ගැන ලියාපු කවිය අහපන්, -

**හැඳුනා කඩිනම් රාලට බඩගින්නක්**
**ගිල්ලා හීතල ඉස්තිරික්කයක්"**





"සොහොයුරනි! වැඩ බැරියා කියන මේ කවි මොනවද? මම කවදාවත් ඉස්තිරික්ක ගිලලා නැහැ," කඩිනම් රාල වේගයෙන් කෑ ගැහැව්වා.

"නුඹ කෑ ගහන්න එපා. මම කවිය ගෙතුවේ එළිසමය රැක ගන්න ඕන හන්දා. හීතල ඉස්තිරික්කයක් කියලා ලියුවේ බඩගින්නක් කියන වචනයට ගැළපෙන විදිහට," වැඩ බැරි කවියා කිව්වා.

"මම හීතල ඉස්තිරික්කයක් හරි රස්නෙ තියෙන ඉස්තිරික්කයක් හරි කවදාවත් ගිලලා නැහැ!"

"ඉතින් මම කියන්නෙ නැහැ නොවැ, ඔයා රස්නෙ තියෙන ඉස්තිරික්කයක් ගිල්ලා කියලා," වැඩ බැරි කවියා කඩිනම් රාලව සනසලා, ඈනුමා ගැන ඔහු ලියපු කවි ගැන මෙහෙම කිව්වා: "ඈනුමා ගැන ලියපු කවි අහපල්ලා!

ඈනුමාගෙ කොට්ටය යට
සඟවා තලප රෑ කෑමට "



ඈනුමා දුවලා ගිහිල්ලා ඈඳේ තිබුණු කොට්ටය ඔසවා බැලුවා.

"හරිම බොරුවක් ! මගේ කොට්ටය යට තලප නැහැ."

"අපේ ඈනුමාට කවි ගැන කිසිම දැනුමක් නැහැ. මම ඒ වචන ලියුවේ එළිසමය අනුව වචන ගළපා ගන්න විතරයි. ඔන්න අහපල්ලා මම එඬරු තෙල් දොස්තර ගැන ලියපු කවිය."

"සෝයුරනි! වැඩ බැරියාගේ මේ විකාරවලට ඉඩ දිය යුතුද? එයා හැම දෙනා ගැනම පට්ටපල් බොරු ලියා තියෙනවා. ඒවා අප ඇසිය යුතු ද?"





"නවත්වාපන්! නුඹගෙ ඔය පල් හෑලි අහන්න අපි තව දුරටත් ලෑස්ති නැහැ. නුඹ ලියා තියෙන්නේ කවි නොවෙයි, මිනිසුන්ට නින්දා කරන බොරු කතා!"

එවිට දක්සපාලයි, කඩිනම් රාළයි, ඈනුමායි විතරක් ඒ අදහසට විරුද්ධ වෙලා කෑ ගැසුවා.

"අනික් අය ගැන ලියපු කවිත් කියවාපන්! අපි ඒවා අහන්න කැමතියි. ඒ ගොල්ල අප ගැන ලියාපු කවිත් ඇහැව්වා නොවේද?"

"නැහැ! ඕන නැහැ. අපි ඒවා අහන්න කැමති නැහැ!" අනික් කුරු ළමයි සියලු දෙනාම එකවර කිව්වා.

"නුඹලා කැමති නැති නම් මම ඒ කවි අල්ලපු ගෙදර මිනිසුන්ට කියවන්නම්" වැඩ බැරි කවියා කිව්වා.



“මොනවා? නුඹ අල්ලපු ගෙදර මිනිසුන් ඉදිරියේ අපට අවමන් කරන්න හදනවද? නුඹ එහෙම කළොත් ආපහු මේ ගෙදරට එන්නේ නැහැ!”

“සෝයුරනි! මම එහෙම කරන්නෙ නැහැ. නුඹලා මා සමග තරහ වෙන්න එපා,” වැඩ බැරි දාස කිව්වා.

ඔන්න ඉතින් එදා සිට කුසුම් පුරයේ වැඩ බැරි දාස කවි ලිවීම අත්හැර දැම්මා.







වැඩ බැරි දාසගේ හපන්කම් ගැන තව දුරටත් ඔබ දැන ගැනීමට කැමති නම්, කුසුම් පුරයේ වැසියන් ගැන දැන ගැනීමට ඔබ ආශා කරතියි නම් මේ පොත් පෙළට අයත් අනික් පොත් කියවන්න:

**සෝඩා වතුරෙන් දුවන රියෙන් වැඩ බැරි දාස ගමන් ගිය හැටි.**
**ගුවනේ පා වෙන බැලුමක් සෑදීමට දක්සපාල කල්පනා කළ සැටි.**


KANOL
PUBLISHING HOUSE (PVT) LTD.

www.kanolbooks.com

Rs. 400/-

071 3493447  011 2760036
facebook.com/kanol publish
kanolpublish@gmail.com
83/16/A, Hokandara East, Hokandara

ISBN 978-624-5937-70-7